# රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳව

# මහජන අදහස් විමසීම

“රජයට අයත් වාණිජමය නොවන ආයතන සමාලෝචනය කිරීම” මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් 2024.12.13 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් යෝජනා කරන ලද කරුණු සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2024.12.18 දින අනුමැතිය ලබා දී ඇත.

එම තීරණය අනුව, රජයට අයත් වාණිජමය නොවන ආයතන මගින් සිදුකරන මහජන සේවාවන් හා නියාමන කාර්යයන් වඩාත් ගුණාත්මකව සිදුකිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත්කර ඇත. එම කමිටුවේ කාර්යභාරය සාර්ථකව සිදුකිරීම සඳහා එම ආයතන මගින් සලසන මහජන සේවාවන්හි ගුණාත්මකභාවය, එම සේවාවන් ලබාගැනීමේදී මහජනතාව මුහුණදෙන ගැටළු සහ සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වන යෝජනා මහජනතාව වෙතින් ලබාගැනීමට කමිටුව විසින් තීරණය කර ඇත.

නිර්දේශිත ආයතන 166 ක ලැයිස්තුව https://pmoffice.gov.lk/soesuggestions.php වෙබ් සබැඳියෙන් බා ගත කරගත හැකිය. එම ලැයිස්තුවේ සඳහන් ආයතන පිළිබඳ ඔබගේ යෝජනා හා අදහස් පහත සඳහන් වෙබ් සබැඳියෙහි ඇතුලත් ආකෘති පත්‍රය පිරවීම මගින් හෝ පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත **2025.01.31** දිනට පෙර යොමු කිරීම මගින් ඉහත කාර්යය සඳහා ඔබගේ දායකත්වය ලබාදිය හැකිය.

වෙබ් සබැඳිය : https://pmoffice.gov.lk/soesuggestions.php

විද්‍යුත් ලිපිනය : soesuggestions@pmoffice.gov.lk

**අග්‍රාමාත්‍ය ලේකම්**

අග්‍රාමාත්‍ය කාර්යාලය

2025.01.